# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

*India's National Spiritual Newspaper*

₹ 10/-

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE

REACHING NATIONS

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVIII　　APRIL 2024　　Issue No. 05


## ශුද්ධවූ බයිබලය

### (ගීතාවලිය 34:1-10)

01. සෑම කල්හිම ස්වාමීන්ට ප්‍රශංසා කරමි. උන්වහන්සේගේ වර්ණනාව මාගේ මුඛයෙහි නිතරම පවත්නේය.

02. මාගේ ආත්මය ස්වාමීන්ගේ ගුණ වර්ණනාකරන්නේය. යටහත් සිත් ඇත්තෝ ඒ අසා සන්තෝෂ වන්නෝය.

03. මා සමඟ ස්වාමීන් වර්ණනාකරව්, අපි එක්ව උන්වහන්සේගේ නාමය උසස්කරමු.

04. ස්වාමීන් සෙව්මි, උන්වහන්සේ මට උත්තරදී, මාගේ සියලු භයින් මා මිදූසේක.

05. ඔව්හු උන්වහන්සේ දෙස බලා එළිය ලැබුවෝය. ඔවුන්ගේ මුහුණු කිසි කලකත් ලජ්ජා නොවන්නේය.

06. මේ දුප්පතා මොරගැසුවේය, ස්වාමීන්වහන්සේ ඔහුගේ බස් අසා, ඔහුගේ සියලු දුක්වලින් ඔහු ගැළවූසේක.

07. ස්වාමීන්ගේ දූතයා උන්වහන්සේට භය ඇත්තන් හාත්පස කඳවුරු බැඳ, ඔවුන් මුදාහරියි.

08. ස්වාමීන් යහපත් බව රස බලා දැනගනිව්. උන්වහන්සේ කෙරෙහි විශ්වාසකරන මනුෂ්‍යයා ආශීර්වාදලද්දේය.

09. ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි, උන්වහන්සේට භයවව්. මක්නිසාද උන්වහන්සේට භයවන්නන්ට කිසි හිඟයක් නැත.

10. තරුණ සිංහයෝ හිඟ ඇතිව සාගින්න විඳිති. නුමුත් ස්වාමීන් සොයන්නන්ට කිසි යහපත් දෙයකින් හිඟයක් නොවන්නේය.



## බිය නොවන්න ! ඔබව මුදවන්නට ගැලවුම්කාරයෙක් සිටියි !

## THERE IS A SAVIOUR TO DELIVER YOU! DO NOT FEAR!!

(සහෝදරී ජෙසී වීනා සැම්)

බයිබලීය මුල් කාල වකවානුව දෙස බලන විටදී දෙවියන්වහන්සේ තම සෙනඟගේ මොරගැසීමට ඇහුම්කන් දුන් බවත් ඔවුන්ගේ වේදනාව දුටු බවත් සියලු විපතින් ඔවුන්ව ගලවාගත් බවත් ඔවුන්ට ගැලවීම දුන් බවත් මෙහි සඳහන්ව තිබේ. මෙම දෙවියන්වහන්සේ අපගේ ගැලවුම්කරු ලෙස වර්ථමානයේ දී ද අපට මගපෙන්වයි. දේව වචනයෙහි සඳහන් කර ඇති පුද්ගලයන් ගැන බලමු.

### (1). මෝසෙස්

මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟව මිසරයෙන් මුදවාගෙන පිටතට පැමිණුනේ කුමන අවස්ථාවකදී දැයි කියා අපි බලමු. නික්මයාමෙ 2 වන පරිච්ඡේදයෙහි මෝසෙස්ගේ උපත ගැන සඳහන් කරයි. ජෝෂෙප් කරණකොටගෙන ඉශ්‍රායෙල් සෙනඟ මිසරයේ සියලුම ආශිර්වාද භුක්තිවින්දේය. නමුත් පසුකාලීනව ඔවුන් එම ජාතියේ වහලුන් බවට පත්විය. ඔවුන් මහත් පීඩාවන් තුළින් වේදනාකාරී ජීවිතයක් ගත කලේය. එවිට ඔවුන් දෙවියන්වහන්සේට මොරගැසුවේය.

3 වෙනි පිටුවට ...




Echo of His Call

Christian YouTube Channel!

An opportunity to pray with Pr. S. Sam Selva Raj!

Message & Prayer in 5 minutes!!


English, Hindi, Tamil & Telugu

Every day – From 2.00 A.M.

Tamil Sunday Service – 8.30 A.M.

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)

REACHING NATIONS



## from your dearly beloved brother...



**"මක්නිසාද ස්වාමීන්වහන්සේ නුඹේ විශ්වාස භූමියව, නුඹේ පය අසු නොවන ලෙස ආරක්ෂා කරනසේක" (හිතෝපදේශ 3:26)**

**යේසුස් වහන්සේ තුළ ප්‍රිය මිත්‍රවරුනි,**

අපගේ ස්වාමීවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහිමාන්විත වූ නාමයෙන් ඔබට උණුසුම් සුභ පැතුම් ගෙනෙමි !

අපගේ සේවාවන් කරණකොටගෙන අපට ඉතා හොඳ ප්‍රතිචාර ලැබී තිබේ. විශේෂයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව භාෂා 16 න්ද කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව හරහා භාෂාවන් 3 කින් බයිබල් පාඩම් මාලාව තුළින්ද භාෂා 2 කින් දේව ධර්මය පාඩම් මාලාවක් ස්ථානයන් 3 ක පවත්වනු ලබන්නාවූ නෙහෙමියා බයිබල් විදුහලත් ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලත් ප්‍රධාන සභාව හා ශාඛා සභාවන් තුළින් අප කරන්නාවූ සියලු සේවාවන් නිසා අපට ඔබගෙන් ලැබෙන්නාවූ ප්‍රතිචාර ඔබගේ උදවු උපකාර සහ යාච්ඤාවන් නිසා අපි ඔබට ස්තුතිවන්ත වෙමු.

ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලේ වසරකට එක් වතාවක් පවත්වාගෙන යනු ලබන උත්සවය 2024 මාර්තු මස 2 වන දින පැවැත්විය. එහිදී දරුවන් ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් ප්‍රදර්ශනය කරනු ලැබීය. බොහෝ දෙමාපියන් හා ළමුන්ද අප පාසල අවට සිටින්නාවූ අයද එය නැරඹීමට පැමිණියෝය.

එසේම මෙම පාසලේම 2024 මාර්තු මස 3 වන දින විශේෂ ළමා හා තරුණ රැළියක් පැවැත්වූ අතර එයට 100 දෙනෙකුට වඩා වැඩි ගණනක් සහභාගී වූ අතර විශේෂ ගීතිකා, සාක්ෂි හා දේව වචනය බෙදා ගන්නා ලදි.

අපගේ සභාවේ සෑම ඉරුදින දේව මෙහෙයන් වල තරුණ තරුණියන් මුණගැසුනි. මෙම සියලුම දරුවන් දේව භයෙන් යුතුව වර්ධනය වෙයි. අපගේ ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලට හොඳ ගුරුවරුන් හා තවත් බොහෝ දරුවන් අවශ්‍යව ඇත. එසේම නෙහෙමියා බයිබල් විදුහලේ හින්දි හා දෙමළ භාෂාවන් වලින් ඉගැන්වීමට හොඳ දාසයින් අවශ්‍යව ඇත.




*Annual Day of St. Paul's Matriculation School*

භාෂා 16 න් නිකුත්කරනු ලබන්නාවූ කැඳවීමේ ප්‍රතිරාවය තවත් බොහෝ අය අතර බෙදා දෙන පිණිස තව තවත් පාඨකයින් අවශ්‍යව ඇත. ඔබගේ ඥාතීන් හා මිත්‍රයින්ගේ ලිපිනයන් ඔබ ළඟ ඇතිනම් එය අප වෙතට ලැබෙන්නට සලස්වන්න. එවිට අපි ඔවුන්ට කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව ඔවුන් වෙතට යවන්නෙමු. තවද උර්දු භාෂාවෙන් මෙම

### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.

HON. EDITOR-IN-CHIEF
Rev. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

HON. MANAGING EDITOR
Pastor Alex Samson Sam, B.Th., M.Div.

GENERAL MANAGER
Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM., MBA.

ADMINISTRATION
Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

EDITORIAL BOARD
Dr. Serena Bevin, M.A., M.Phil., B.Ed.
Sis. Sajini Cherian
Sis. L. Mariya Anjalin, M.A., M.Sc., B.Ed.
Rev. Dr. K.R. Rajasekaran

EDITOR, PUBLISHER & PRINTER
Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766
Cell : (+91) 98410 71852, 98412 71858
95661 31858

E.MAIL
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

WEBSITES
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

YOUTUBE CHANNEL
Echo of His Call

Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ✿ BIBLECOR - Postal Courses (3 languages) ✿ YouTube Ministry ✿ Online Courses ✿ Theological Correspondence Courses (2 languages) ✿ Church Planting ✿ Nehemiah Bible Colleges ✿ Gospel Printing Press ✿ Great Commission Partners ✿ St. Paul's Matriculation School ✿ Crusades ✿ Community Development



Children and Youth Rally



Nehemiah Bible College Board Meeting

සඟරාව තවත් අයට යවන පිණිසද යාච්ඤා කරන්න.

මුළු ලෝකයෙහිම තිබෙන්නාවූ සෑම රටකම සමාදානය තිබෙන පිණිස අප අපගේ පුද්ගලික යාච්ඤාවන් වලදී යාච්ඤා කරමු. දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ කෙරෙහිද ඔබගේ පවුල කෙරෙහිද වගුරන්න කියා යාච්ඤා කරමු.

පූජක M. මුත්තුගේ නායකත්වය යටතේ අපගේ නෙහෙමියා බයිබල් විදුහල කාකර මඩුල්ල සෑම මසකදීම රැ



Prayer for students appearing
Public Examination

ස්වෙති. එසේම අලුතින් අප හා සමඟ එකතු වී සිටින පූජක ජෝන් රාජරත්නම් විදුහල්පති තුමා සමඟ මෑතකදී මේ පාසලේ දියුණුව උදෙසා සාකච්ඡාවක් පැවැත්වුවෙමු.

ඔබ අප වෙත එවන්නාවූ විද්‍යුත් තැපැල් ලිපි හා දුරකථන ඇමතුම් ආදී සියල්ලම අපට බොහෝ ශක්තියක් ලැබෙනු ඇත. ඔබගේ විශේෂ යාච්ඤාව අපගේ කාර්යාලයේ සේවක මඩුල්ල නිසාත්, සභාවේ සේවකයන් නිසාත්, සහකාර කර්තෘවරුන් නිසාත්, පාලකවරුන් නිසාත්, ඉවැන්ජලිස්තවරුන්, ඉරුදින පාසලේ ළමුන්, පාසලේ ළමුන්, බයිබල් විදුහල, මුද්‍රණාලය, කාර්ය මණ්ඩලයේ අපගේ බොහෝ අය අසනීපයෙන් සිටින නිසා මේ සෑම දෙනා උදෙසාම ඔබගේ යාච්ඤාවේදී යාච්ඤා කරන්න.

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**
**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සෑම්සන් සෑම්**
(+91) 98412 71858 / 98410 71858, E.mail : sam@echoofhiscall.org

---

*....Contd. from page* 1

ඉශ්‍රායෙල් සෙනඟ මිසරයේ වසර 400 ක් වහලුන් ලෙස සිටින බවට දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට කලින්ම සඳහන් කර තිබුණි. ***(උත්පත්ති 15:13) උත්පත්ති 15:16*** හි ''සතරවෙනි පරම්පරාවේදී ඔවුන්ව නැවත ගෙනෙන්නේය.'' කියා අනාවැකියක් පවසා තිබුණි.

ඉශ්‍රායෙල් සෙනඟ ඔවුන් විඳින දුක් දරා ගැනීමට නොහැකිව මෙසේ පවසනු ලැබීය. ''අහෝ ස්වාමීනි, අප ගැන අනුකම්පා කරමින් ඵාරාවෝගේ නපුරු අතින් අපව මුදවන්න. අපගේ මුල් පියවරුන්ට ඔබ පොරොන්දු වූ ලෙස කිරියෙන් හා පැණියෙන් උතුරා යන දේශයට ගෙන යන්නේ කවදාද? අපගේ දෙවියන්වහන්සේට නිදහසේ නමස්කාර කරමින් පූජාවන් ඔප්පු කරන්නේ කවදාද?'' කියා මොරගැසුවේය.

ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ දරුවන්ව සෝදිසි කරනු ලැබුවත් ඔවුන්ට දරා ගැනීමට නොහැකි තරම් සෝදිසි කරන්නේ නැත. උන්වහන්සේ ඔවුන්ගේ මොරගැසීමට ඇහුම්කන් දුන්නේය. උන්වහන්සේගේ ප්‍රේමණීය හදවත නිසා උන්වහන්සේගේ ඇස් ඉදිරියෙහි ඔවුන්ට කරුණාව ලැබුනේය.

ඵාරාවෝගේ බලවත් වූ හස්තයෙන් ඔවුන්ව මුදවාගන්නා පිණිස දෙවියන්වහන්සේ මෝසෙස්ව තෝරාගනු ලැබුවේය. ඔහුගේ මවගේ කුසේ පටන් ඔහුව ගැලවුම්කරුවෙකු ලෙස තෝරා ගනු ලැබුවේය. ***(ගීතාවලිය 139:16)*** මිසරයේ සිටි වයස අවුරුදු 2 න් පහළ සියලු හෙබ්‍රෙව් දරුවන්ව මරා දැමීමට ඵාරාවෝ විසින් අණකර තිබුනත් දෙවියන්වහන්සේ මෝසෙස්ව ඉතා පුදුමාකාරයෙන් ආරක්ෂා කරනු ලැබුවේය. මෝසෙස්ගේ මව මාස තුනක් ඔහුව හංගාගෙන සිටියත් ඊට වඩා ඔහුව සඟවා තබා ගැනීමට නොහැකි වූ නිසා ඔහුව පන් පෙට්ටියක දමා දරුවාව එහි තබා ගං ඉවුරේ පන්ගස් අතරේ තැබුවෝය.

පසුව ඵාරාවෝගේ දියණිය මෝසෙස්ව ඵාරාවෝගේ මාළිගාවට ගෙන ගියාය. ඔහු එහි ජීවත් විය. එතනින් ඔහු කාන්තාරයට පැන ගොස් වසර 40 ක් පුරාවට බැටළුවන්ව බලාගෙන සිටියාය.

මේ කාලයේදී දෙවියන්වහන්සේ ඔහුව පුහුණු කලේය. මෝසෙස් කාන්තාරයෙහි සිටින විටදී ඇවිලෙන ගිනි පඳුරක් දුටු අතර මෙය සිදු වෙන්නේ

කෙසේද කියා ඔහු මවිතයට පත් විය. ගින්න තිබුනත් පඳුර ඇවිලුනේ නැත. එය බැලීමට ඔහු ගිනි පඳුර ළඟට ගිය විටදී දෙවියන්වහන්සේ කථා කරමින්, ''මෝසෙස්, මෝසෙස් ඉශ්‍රායෙල් සෙනඟගේ මොරගැසීම මට ඇසුනි. ඔබ ඵාරාවෝ වෙතට ගොස්, ආබ්‍රහම්ටත් ඊසාක්ටත් පොරොන්දු වූ දේශයට මාගේ සෙනඟව ගෙනයන පිණිස මිසර දේශයෙන් පිටත්කර හරින පිණිස කථා කරන්න.'' ය කියා පැවසීය.

මෙහිදී මෝසෙස්ගේ අවිශ්වාසය නිසා මා යන්නේ කෙසේද? කියා ක්ෂණික ප්‍රශ්නයක් නැගුවේය. නමුත් දෙවියන්වහන්සේ ඔහුට කථා කරමින්, ''මා නුඹ සමඟ සිටිමි. ඔබ වෙනුවෙන් කථා කිරීමට ඔබගේ සහෝදරයා වූ ආරොන්ව රැගෙන යන්න'' කියා පැවසීය.

දෙවියන්වහන්සේ අපට යමක් කරන්නට කියා මඟපෙන්වන විටදී අප එයට සමාවට කරුණු නොපවසා අපගේ ආත්මාර්ථකාමී සිතුවිලි කරුණු නොපවසා අපගේ ආත්මාර්ථකාමී සිතුවිලි වලට ඉඩ නොදී සම්පූර්ණ ලෙසම එයට කීකරු වී ක්‍රියා කල යුතුය.

කෙසේ වෙතත් මෝසෙස් දෙවියන්වහන්සේට කීකරුවූවෝය. ඉශ්‍රායෙල් සෙනඟව මිසරයේ වහල්කමින් මුදවාගන්නා පිණිස දෙවියන්වහන්සේ මෝසෙස්ට මිත්‍රයෙකුට කථාකරන්නාක් මෙන් මුහුණට මුහුණ කථා කලේය. ***(ගීතාවලිය 33:11)*** දෙවියන්වහන්සේ විසින් තෝරාගත් මෝසෙස්, හාස්කම් හා අඩයාලම් කරමින් ඉශ්‍රායෙල් සෙනඟව මිසරයෙන් පිටතට ගෙනෙන පිණිස නායකත්වය දුන්නේය. මේ සම්බන්ධව නික්මයාම 14 වන පරිච්ඡේදයෙහි අපට කියවීමට හැකිය. ඵාරාවෝ ඉශ්‍රායෙල් සෙනඟව නිදහස් කල පසු ඔහුගේ හිත වෙනස් වී නැවත ඉශ්‍රායෙල්වරුන්ව අල්ලාගැනීමට තම රථ සේනාව ඔවුන්ව අල්ලා ගැනීමට ලුහුබැඳ ආවා. ඉශ්‍රායෙල්වරු රතු මුහුද ළඟට පැමිණ එහි නැවතී සිටින විටදී ඔවුන් පිටුපසින් සතුරු සේනාව පැමිණියත් දෙවියන්වහන්සේ ඔවුන්ව ආරක්ෂා කලේය.

දෙවියන්වහන්සේගේ උපදෙස් වලට අනුව මෝසෙස් තම සැරයටිය රතු මුහුද දෙසට දිගුකල විටදී එ මුහුද දෙබෑවී යවිළි බිමක් මතුවූ අතර ඉශ්‍රායෙල් සෙනඟ එම වියලි පොළොව මත ඇවිදිමින් රතු මුහුදින් එතෙර වීමට හැකිවිය. ඵාරාවෝගේ සේනාවද ඉශ්‍රායෙල් සෙනඟව ලුහුබැඳ රතු මුහුද මැදින් ගමන් කල මුත් ඉශ්‍රායෙල් සෙනඟ එතෙරවූ පසු නැවත රතු මුහුද එක් වූ විටදී ඵාරාවෝගේ මුළු සේනාවම රතු මුහුදේ ගිලී විනාශ විය. මෙසේ මෝසෙස් දෙවියන්වහන්සේගේ සෙනඟව මුදවාගන්නා පිණිස ගැලවුම්කාරයෙක් ලෙස ක්‍රියා කරනු ලැබීය.

## (2). ඔත්නියෙල්

ඉශ්‍රායෙල්වරු කොපමණ ආශ්චර්‍යයන් හා හාස්කම් දුටුවත් ඔවුන් පාපයට වැටුනි. කානාන්හි අන්‍ය දෙවිවරුන්ට නමස්කාර කලා. වසර අටක් පුරාවටම අන්‍ය ජාති රජවරුන් යටතේ වහල්කමෙහි සිටියා. ***(විනිශ්චයකාරයන්ගේ පොත 3:1-11)***

අපගේ දෙවියන්වහන්සේ ඉශ්‍රායෙල් සෙනඟ පවුකලා කියා ඔවුන්ව අතහැරියේ නැත. දෙවියන්වහන්සේගේ සෙනඟ ඔවුන්ව මුදවන්නය කියා උන්වහන්සේට මොරගැසූ විටදී ***යෙසායා 54:7*** හි සඳහන් කර ඇති පරිදි, ***''මම ලුහුඩු මොහොතකට නුඹ අතහැරියෙමි. නුමුත් මහත් අනුකම්පාවලින් නුඹ නැවත කැඳවාගන්නෙමි.''*** කියා පවසමින් දෙවියන්වහන්සේ ඔවුන්ව මිදෙව්වේය. ***(විනිශ්චයකාරයන්ගේ පොත 3:9-10)*** වසර 40 පුරාවටම දේශයෙහි සමාදානය පැවතුනි. දෙවියන්වහන්සේ කාලයේදී ඔත්නියෙල්ව ගැලවුම්කාරයෙක් ලෙස ඉශ්‍රායෙල් උදෙසා පාවිච්චි කලේය.

## (3). ගිඩියොන්

දැන් අපි ගිඩියොන්ගේ ක්‍රියාවන් දෙස බලමු. ***''ඉශ්‍රායෙල් පුත්‍රයින් වනාහි ස්වාමීන්වහන්සේගේ ඇස් හමුයෙහි නපුරුව තිබුණි දේ කලෝය. ස්වාමීන්වහන්සේ ඔවුන් මිදියන්වරුන් අතට සත් අවුරුද්දකට පාවා දුන්සේක.'' (විනිශ්චයකාරයන්ගේ පොත 6:1)***

මිදියන්වරුන් හා අමලෙක්වරුන් නිසා ඉශ්‍රායෙල් සෙනඟ බොහෝ පීඩනයට පත් විය. ඔවුන්ගේ සියලුම භෝග එළ නාස්ති කලෝය. ***(විනිශ්චයකාරයන්ගේ පොත 6:2 - 5)*** ඔවුන්ගේ පීඩනයේදී ඔවුන් දෙවියන්වහන්සේට මොරගැසුවේය. දෙවියන්වහන්සේ ඔවුන් වෙතට අනාගතවක්තෘ කෙනෙකු එවූ සේක. ඔහු තුළින් දෙවියන්වහන්සේ අමෝරිවරුන්ගේ දෙවිවරුන්ට භය නොවන්නය කියා

*....Contd. to page 6*

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1969

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**අප්‍රේ:19-** කැඳවීමේ ප්‍රතිරාවය YouTube නාලිකාව තුළින් විවිධ භාෂාවන් කථා කරන්නාවූ අයගේ ගැලවීම උදෙසා ස්තුති කරන්න.

**අප්‍රේ:20-** ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබලු විද්‍යාල හා බයිබල් පාඩම් මාලාවට උන්වහන්සේ කල ආශිර්වාද නිසා ස්තුති කරන්න.

**අප්‍රේ:21-** කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ සේවක මඩුල්ල සහ ඔවුන්ගේ පවුල් දෙවියන්වහන්සේ ආරක්ෂා කරන නිසා ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:22**- අපගේ යාච්ඤා හවුල්කාරයින්, උපකාර කරන්නාවූ අය, ඇදහිල්ලේ පංගුකාරයින්, උන්වහන්සේගේ මහා ආඥාව ක්‍රියාත්මක කරන්නාවූ අය සහ ඔවුන්ගේ පවුල් වලට දෙවියන්වහන්සේගේ කරුණාව තිබෙන නිසා ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:23-** 2024 මාර්තු මස ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලේ වාර්ෂික සැමරුමට දෙවියන්වහන්සේ ආශිර්වාද කල ඇති නිසා ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:24-** මාර්තු මස 3 වන දින අපගේ තරුණ තරුණියන්ගේ යාච්ඤා රැස්වීම නිසාත් එහිදී දෙවියන්වහන්සේ කළාවූ සියලුම ආශිර්වාදයන් නිසාත් ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:25-** අපගේ තරුණ තරුණියන්ව දෙවියන්වහන්සේ ධෛර්යයහත් කල නිසාත් ඔවුන්ව සභාවේ සේවාවන් වලදී පාවිච්චි කරන නිසාත් අපි ස්තුති ප්‍රශංසා කරමු.

**අප්‍රේ:26-** ශාන්ත පාවුල් මෙට්‍රිකියුලේෂන් පාසලේ රජයේ විභාගයට සාර්ථකව මුහුණදෙනු ලැබූ 10 වෙනි පංතියේ ඉගෙන ගත් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිසා ස්තුති ප්‍රශංසා කරමු.

**අප්‍රේ:27-** අපගේ සියලු සභාවන් නිසාත් ඉරුදින පාසැල් නිසාත් තරුණ තරුණියන් නිසාත් පාසැල් සේවය නිසාත් දෙවියන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු.

**අප්‍රේ:28-** අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාල පරීක්ෂා කිරීමට පැමිණි ATA කණ්ඩායම නිසාත් දෙවියන්වහන්සේ කල ආශිර්වාද නිසාත් උන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු.

**අප්‍රේ:29-** කැඳවීමේ ප්‍රතිරාවයෙහි නිර්මාතෘ හා ඔහුගේ පවුලේ සියලු දෙනා දෙවියන්වහන්සේ ආරක්ෂා කරන නිසා උන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරන්න.

**අප්‍රේ:30-** අපගේ මුද්‍රණාලය මගින් භාෂා 16 කින් මුද්‍රණය කර පිට පළාත් වලට බෙදා හරිනු ලබන්නා සඟරාවට දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා උන්වහන්සේට ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි:01-** 2023 - 2024 යන මූල්‍යමය වසර තුලදී දෙවියන්වහන්සේ ආශිර්වාද කර තිබෙන නිසා ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි:02-** අප හා සමඟ වැඩ කරන සම්බන්ධීකාරකයින් කර්තෘවරුන්, උප කර්තෘවරුන් හා ඔවුන්ගේ පවුල් නිසා ස්තුති ප්‍රශංසා කරමු.

**මැයි:03-** අපගේ සේවා ස්ථාන වල සේවය කරනු ලබන සෑම කෙනෙක් නිසාත් ඔවුන්ගේ කැපවීම නිසාත් දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන්න.

**මැයි:04**- දැනට තිබෙන්නාවූ උෂ්ණාධික කාලගුණය තුලදී දෙවියන්වහන්සේගේ දිව්‍යමය ආරක්ෂාව උදෙසා යාච්ඤා කරමු.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**මැයි:05-** මේ ලෝකයට දරුවන්ව බිහි කර එම දරුවන්ව රැකබලා ගන්නාවූ මව්වරුන් උදෙසා යාච්ඤා කරමු.

**මැයි:06-** ඉශ්‍රායෙල්, පලස්තීන, යුක්රේන් හා රුසියාව යන රටවල සමාදානය ඇතිවෙන්න කියා යාච්ඤා කරන්න.

**මැයි:07-** අපගේ ප්‍රධාන පාලකතුමාගේ ආත්මික හා ශාරීරික අවශ්‍යතා උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:08-** මේ නව වසරේදී අපගේ ආර්ථික තත්වය ඉහළට යන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:09-** දේවගැති ජොනී සහ ඔහුගේ පවුලට දෙවියන්වහන්සේගේ දිව්‍යමය සැපයීම ලැබෙන්නය කියා යාච්ඤා කරන්න.

**මැයි:10-** අපගේ ශුභාරංචි උදෙසාත් එහ දිනපත කරගෙන යනු ලබන කටයුතු උදෙසාත් යාච්ඤා කරන්න.

**මැයි:11-** අපට ලැබෙන්නට තිබෙන්නාවූ ATA පිළිගැනීම ලැබෙන්නය කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**මැයි:12-** අපගේ සංවිධානය තුළ කරන්නාවූ සියලුදෙනා අතර සමාදානය හා එකමුතුකම නිතරම තිබෙන පිණිස යාච්ඤා කරන්න.

**මැයි:13-** 2024 ජූනි 01 වන දින අප පැවැත්වීමට බලාපොරොත්තුවෙන්නාවූ නෙහෙමියා බයිබල් විද්‍යාලේ උපාධි ප්‍රධාණෝත්සවය නිසා යාච්ඤා කරන්න.

**මැයි:14-** 2024 - 2025 වර්ෂය සඳහා නෙහෙමියා බයිබල් විද්‍යාලට අලුතින් බඳවාගන්නාවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:15-** ශානත් පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසලේ 2024 - 2025 යන වසර උදෙසා අලුතින් බඳවාගන්නාවූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:16-** දිගුකාලීනව රෝගාතුරව රෝහල්වල සිටින්නාවූ සියලු දෙනා උදෙසා යාච්ඤා කරන්න.

**මැයි:17-** දෙවියන්වහන්සේට භය වෙන්නාවූ, නායකයින් සහ උන්වහන්සේට ගරු කරන්නාවූ නායකයින්ව රටවල් වලට පත් කරන්නය කියා දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**මැයි:18-** සියලු මිෂනාරීවරුන් සහ දේව සේවයට විරුද්ධව ඇති වෙන්නාවූ සියලු විරුද්ධතාවයන් හා ඒවා උන්වහන්සේම පාලනය කරන පිණිස යාච්ඤා කරන්න.

....Contd. from page 4

පැවසූ සේක. ***(විනිශ්චයකාරයන්ගේ පොත 6:8 - 10)***

ඉශ්‍රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට විරුද්ධව ක්‍රියා කලත් ඔවුන් මොරගසන විටදී දෙවියන්වහන්සේගේ හදවත අනුකම්පාවෙන් පූර්ණවී ඔවුන්ව ගලවන පිණිස උන්වහන්සේ මනුෂ්‍යයෙක්ව තෝරාගෙන ඔහුව නැගිට්ටෙව්වේය.

අපද දෙවියන්වහන්සේගේ හඬට ඇහුම්කන් නොදී ජීවත් වෙන අතර අපගේ ජීවිතයටද කිසියම් කරදරයන්ට මුහුණ දීමට සිදු වන විටදී අප උන්වහන්සේට හඬනගන විට උන්වහන්සේ අපගේ කරදර වලින් මුදවාගැනීමට සූදානමින් සිටිනු ඇත.

ඉශ්‍රායෙල් සෙනඟව ඔවුන්ගේ කරදර වලින් මුදවන පිණිස දෙවියන්වහන්සේ දේව දූතයෙක් එවනු ලැබීය. එම දේව දූතයා, ***"ස්වාමීන්වහන්සේගේ දූතයා ඇවිත් අබියේශ්‍රීය යෝවාෂ්ට අයිතිවූ ඔප්‍රාහි තිබෙන ආලෝන ගස යට හිඳගත්තේය. යෝවාෂ්ගේ පුත්‍රවූ ගිඩියොන් මිදියන්වරුන්ගෙන් තිරිඟු සඟවාගන්න පිණිස ඒවා මුද්‍රික යන්ත්‍රයෙහි මඩිමින් සිටියේය. ස්වාමීන්වහන්සේගේ දූතයා ඔහුට පෙනී, ධෛර්‍ය්‍යමත් බලවත් මනුෂ්‍යය ස්වාමීන්වහන්සේ නුඹ සමඟ සිටිනසේක." (විනිශ්චයකාරයන්ගේ පොත 6:11-12)***

නමුත් ගිඩියොන්ද මෝසෙස් මෙන් සමාවට කරුණු පැවසීය. ***"...සැබවින්ම මම නුඹ සමඟ සිටින්නෙමි, නුඹ එක්කෙනෙකුට මෙන් මිදියන්වරුන්ට පහරදෙන්නෙහියයි ඔහුට කී සේක." (විනිශ්චයකාරයන්ගේ පොත 6:15 - 16)***

ගිඩියොන් තවමත් දෙවියන්වහන්සේ විශ්වාස කිරීමට අදිමදි කරමින් උන්වහන්සේ විශ්වාස කරන පිණිස ලකුණක් ඉල්ලුවේය. එම ලකුණු සියල්ල ඉල්ලූ පසු ඔහු සමඟ සිටි මනුෂ්‍යයන් සමඟ මිදියන්වරුන්ට විරුද්ධව සටනට ගියේය.

දෙවියන්වහන්සේ ගිඩියොන්ට කථා කොට, 'බොහෝ සොල්දාදුවන් සටනට ගෙන නොයන්න. මන්ද ඔවුන සටනෙන් ජයගත් විටදී ඔවුන්ගේ බලයෙන් සටන ජයගත්තේය කියා පවසනු ඇතැයි' කියා පවසනු ලැබීය. එම නිසා දෙවියන්වහන්සේගේ මගපෙන්වීමට අනුව සෙනඟ 300 තෝරාගෙන ඉතිරි අයව නිවෙස්වලට පිටත්කර හරිනු ලැබීය. ***(විනිශ්චයකාරයන්ගේ පොත 7:8)***

මිදියන්වරු මිටියාවතෙහි සැඟවී සිටියේය. එදා රාත්‍රියේදී දෙවියන්වහන්සේ ගිඩියොන්ට මෙසේ අණකරනු ලැබීය. ***"මිදියන්වරුන්ද අමලෙක්වරුන්ද පූර්ව දිශාවේ සියලු වැසියෝද ගණනින් පළඟැටියන් මෙන්, මිටියාවතේ පැතිර සිටියෝය. ඔවුන්ගේ ඔටුවෝද ගණනාවක් නැතුව මුහුදු වෙරළේ වැලි මෙන් බොහෝව සිටියෝය." (විනිශ්චයකාරයන්ගේ පොත 7:12)***

ගිඩියොන් මිදියන්වරුන්ගේ කඳවුරට ගොස් ඔවුන් කථාකරන්නාවූ දෙයට ඇහුම්කන් දුන්නේය. ***(විනිශ්චයකාරයන්ගේ පොත 7:10 - 14)***

ගිඩියොන්ද ඔවුන් සමඟ සිටි මනුෂ්‍යයන්ව කණ්ඩායම් තුනකට බෙදා ඔවුන් සියල්ලන් අතට හොරණෑද ඇතුලේ පන්දම් ඇති හිස් කළල දී ඔවුන් කඳවුර වටේ සිට සියල්ලෝම එකට හොරණෑ පිඹ තමුන්ගේ අත්වල තිබූ කළගෙඩි බිඳ වමතින් පන්දමද දකුණතින් හොරණෑද අල්ලාගෙන ස්වාමීන්වහන්සේගේද ගිඩියොන්ගේද කඩුවයයි කියා මොරගැසුවේය. *(විනිශ්චයකාරයන්ගේ පොත 7:20)*

කඩුවක්වත් ආයුධයක්වත් නොමැතිව ඔවුන්ට ඉතා පුදුමාකාර ලෙස දෙවියන්වහන්සේ ජය ගෙනදුන්නේය. මිදයන්වරු ඔවුන් එකිනෙකාට විරුද්ධව කඩුව ඔසවා එකිනෙකා පමණක් මරාගත්තේය. මෙම ජයග්‍රහණය දෙවියන්වහන්සේගේ දීමනාවකි. ඉශ්‍රායෙල්වරුන්ව ගලවාගත් ලෙසම දෙවියන්වහන්සේ ගිඩියොන්ව පාවිච්චි කලේය. ඔහු වසර 40 ක් දේශයෙහි විනිශ්චයකාරයෙක් ලෙස සිටි අතර ඔහුගේ කාලයෙහි දේශයෙහි සමාදානයද තිබුණි. (විනිශ්චයකාරයන්ගේ පොත 7:22)

අපගේ කරදර හා පීඩාවේදී අප දෙවියන්වහන්සේ ගේ බලය ගැන විශ්වාස කරමින් ප්‍රශංසා කරන විටදී අපගේ දුක උන්වහන්සේ ප්‍රීතියට හැරවුවේය.

ගැලවුම්කාරයෙක් ලෙස ගිඩියොන්ගේ ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ සෙනඟට

ඇහුම්කන් දෙන බවට ඔප්පු කලේය. අපට තිබෙන්නාවූ මහත්වූ පීඩා කාලයේදී අප දෙවියන්වහන්සේට කන්නලව් කරන විට උන්වහන්සේ අප උදෙසා ක්‍රියා කරන සේක.

සමහර අවස්ථාවන් වලදී අප තනියම ගමන් කරන විටදී බොහෝ දේ තුළින් අප අපහසුතාවයන්ට පත්වීමට පුළුවනි. අප කනස්සල්ලට පත්වන විටදී අපට උදවු උපකාර කිරීමට, අපත් සමඟ කථා කිරීමටත් උන්වහන්සේ අප වෙතට ගැළවුම්කාරයෙක් ලෙස යම් යම් අය එවනු ලැබීය.

සමහර අවස්ථාවන් වලදී අප රෝගාතුරුවී රෝහලේ සිටින විටදී කවුරුන් හෝ වෛද්‍යවරියක් හෝ හෙදියක් හෝ අපට ඉතා ප්‍රේමයෙන් කථා කරනු ලබන්නාවූ ගැලවුම්කාරයෙක් ලෙස මේ අයව උන්වහන්සේ අප වෙතට එවයි. මෙවැනිවූ අත්දැකීම් අප බොහෝ දෙනෙකුට ඇත.

ස්වාමීන්වහන්සේ අපගේ දකුණු පැත්තෙහි අපගේ සෙවනැල්ලක් ලෙස සිටිමින් අපව ආරක්ෂා කරයි. අපගේ වැරදි අප පිළිගෙන දෙවියන්වහන්සේ සමඟ ඒවා හරිස්සාගෙන අප ඉදිරියටම යමු.

## (4). යෝනා

යෝනා ප්‍රොපේතවරයෙකි. දෙවියන්වහන්සේ ඔහුට කථා කරමින්, නිනිවය නම් නුවරට ගොස්, ඔවුන්ගේ වැරදි ක්‍රියා වලින් හැරෙන්නය කියා අවවාද කරන්නය කියා පවසනු ලැබීය. නමුත් යෝනා එයට අකීකරු වී තර්ෂිෂ්ට යන නැවකට නැග බොහෝ කරදර වලට මුහුණ දුන්නේය.

යෝනා දෙවියන්වහන්සේට අකීකරු වී ගමන්කරන්නාවූ කෙනෙක් බව නැවේ සිටි අය දැනගත් විටදී ඔවුන් යෝනාව රැගෙන මුහුදට විසි කලේය. එහිදී දෙවියන්වහන්සේ ඔහුව ගිලින පිණිස විශාල මාළුවෙකුට අණ කරනු ලැබීය. එම අවස්ථාවේදී යෝනාගේ ජීවිතය බේරාගැනීමට මෙම මාළුවා යෝනාගේ ගැලවුම්කාරයා විය. දින තුනකට පසුව මෙම මාළුවා නිනිවයේ මුහුද වෙරළට යෝනාව වමාරා ගියේය.

මෙතුළින් යෝනා තම ජීවිතයට පාඩමක් ඉගෙනගත් අතර ඔහු නිනිවයේ සෙනඟට පාපය ගැන කථා කරමින් ඔවුන්ට පසුතැවිලිවීමට ගෙන ආවේය. ඔහු නිනිවයේ නුවර ගැලවුම්කාරයෙක් විය. ඉහත දී අප බැලූ සෑම කෙනෙක්ම ගැලවුම්කාරයෙක්ම මැරුණු පසු මනුෂ්‍යයා නැවත පාපිෂ්ඨ වූ ජීවිතයට හැරුනි. දෙවියන්වහන්සේ තම ඒක ජාතක වූ පුත්‍රවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව මනුෂ්‍යයෙක් හැටියට පාපය රහිතව කුරුසියට යවනු ලැබීය. උන්වහන්සේගේ රුධිරය හෙලනු ලැබීය. අපගේ පාපය නිසා උන්වහන්සේගේ ජීවිතය පූජා කරනු ලැබූ අතර තුන්වන දින මළවුන්ගෙන් නැගිටනු ලැබ අද අප අතර උන්වහන්සේ ජීවමානව වැඩ සිටී. අපට සදාකාල ජීවනය ලබා දී ඇත.

අප තුළ කෙතෙරම් වැරදි තිබුනත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපගේ ගැලවුම්කරු ලෙස අපට මඟපෙන්වයි. අපව නිවැරදි කර අපව ආරක්ෂා කරයි. උන්වහන්සේගේ කැමැත්තට අනුව අපට මඟපෙන්වයි. අප ස්වර්ගයට යන තුරුම අප දෙස බලා සිටී.

මා එක් වැදගත් වූ කාරණාවක් පැවසීමට කැමැත්තෙමි. ප්‍රියා සහෝදරයා, සහෝදරිය, ''දෙවියන්වහන්සේට ළංවෙයල්ලා. එවිට දෙවියන්වහන්සේ නුඹලාට ළංවෙන සේක.'' *(යොහාන් 4:8)*

*....Contd. to page 10*

**NEHEMIAH BIBLE COLLEGE**

**Graduation Service, 2023-2024**

**Venue : BKN Hall, Vepery, Chennai – 07.**
**Date : 1st June, 2024 (Saturday)**
**Time : 5.00 P.M.**





About 50 students will complete their studies and will be sent to the mission field.

We need 75 students for the Tamil and Hindi courses for the academic year 2024-2025. Please pray for this request. Admissions are going on for the next academic year 2024-2025.



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**''...කියවන්නා තේරුම් ගනීවා....''** *(මතෙව් 24:15)*


## JESUS CHRIST IS THE SAME YESTERDAY, TODAY, AND FOREVER

''නුඹේ බර ස්වාමීන් පිට තබව, උන්වහන්සේ නුඹ උසුලනසේක...'' (ගීතාවලිය 55:22)

1969 වන වර්ෂයේදී ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ වෙනස් වූ අත්දැකීමට ගෙන ආවේය. මේ ගැලවීම අත්දැකීම නිසා මගේ පරණ මිත්‍රයින් මගෙන් ඈත් වී මට නපුර කිරීමට උත්සාහ කලේය. නමුත් ස්වාමීන්වහන්සේ උන්වහන්සේගේ ඇසේ කලු ඉංගිරියාව මෙන් මා ආරක්ෂා කරනු ලැබීය. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඇතිව මා 1971 වන වසරේදී චෙන්නෙයි නුවරට පැමිණියෙමි. චෙන්නෙයි වලට මා පැමිණි පළමු දිනයේදීම මගේ ජීවිතයට මහත්වූ අත්දැකීමක් ලැබුණි. එදින මා හට නැවතීමට කිසිම ස්ථානයක් නොතිබුණ නිසා එම රාත්‍රිය මා පාරේම ගත කෙරුවෙමි. එම රාත්‍රිය පුරාවටම මා ඉතා භයෙන් නිදි වර්ජිතව ගත කලෙමි.

උදේ පාන්දර 2.00 ට පමණ පොලිස් නිළධාරීන් දෙදෙනෙක් මා සිටි ස්ථානයට පැමිණ, මා ගැනද මගේ පවුලේ පසුබිම ගැනද ඔවුන් මගෙන් ඇසුවේය. එසේම මා යේසුස් වහන්සේව පිළිගත් ආකාරයත් මගේ ජීවිතය කෙලෙස වෙනස්වූවේද කියාත් ඔවුන්ට මා පැවසුවෙමි. ඔවුන් මගේ කථාව අසා මා තුළ කිසිම වරදක් නොමැති බව දැනගත් විටදී ඔවුන් ''මේ රෑ පාරේ නිදාගන්නේ ඇයි?'' කියා මගෙන් ඇසුවේය. එසේම එහි සිටි එක් නිළධාරියෙක් පොළිසියට යාමට කැමතිදැයි කියා මගෙන් ඇසුවේය.

නමුත් අනෙක් නිළධාරියා 'අපිත් එක්ක එන්න' කියා මා දෙස බලමින් පැවසුවේය. ඔහු මාව පොළීසිය වෙතට රැගෙන විත් එදා රාත්‍රියේදී මා හට සිටීමට පොළිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන්නාවූ අයෙකුගේ ගරාජයෙහි නිදාගැනීමට සැලැස්සුවෙමි. ''මෙය ඉතා ආරක්ෂිත ස්ථානයක්, නමුත් සෑම රාත්‍රියකදීම මේ ගරාජයට සර්පයෙක් පැමිණෙන අතර ඌගෙන් කිසිවෙකුට හානියක් සිදුවෙන්නේ නැහැ, ඒ නිසා කනස්සල්ලට පත් නොවෙන්න'' කියා ඔහු මට පැවසුවේය.



එසේම 'එම සර්පයා ආ විට ඔබ නිහඬවම සිටින්න. ඔබට ආරක්ෂාව දෙන්නාවූ ඔබගේ දෙවියන්වහන්සේ ඔබට බලාගනියි' කියා ඔහු නැවත


**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for** BIBLECOR



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

**The Chairman, Nehemiah Bible College,** Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in

# MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :
   English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikan.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Nehemiah Bible Colleges (Three Centres) (Evening / Residential)
5. Theological Correspondence Courses: English & Tamil
6. Great Commission Partners (Network of Pastors)
7. Training Programmes
8. Crusades
9. Literature Distribution and Follow Up
10. Gospel Printing Press - Publications
11. St. Paul's Matriculation School - Village English High School
12. Sunday Schools : 10.30 a.m. & 4.00 p.m. Sunday
13. **Early Morning Service : 5.30 a.m. Sunday**
14. **Tamil Service : 8.30 a.m. Sunday**
15. **Youth Service : 11.00 a.m. Sunday**
16. **Fellowship Lunch : 12.30 p.m. Sunday**
17. **Travel to Mission Centres : 1.30 p.m. Sunday**
18. **Children Ministry : 3.00 p.m. Sunday**
19. **Hindi Service : 4.00 p.m. Sunday**
20. **Telugu Service : 5.00 p.m. Sunday**
21. **Telugu, Hindi & Telugu Service : 6.00 p.m. Sunday**
22. Women's Prayer : 5.30 p.m. Wednesday
23. Men's Prayer : 7.00 p.m. Friday
24. Discipleship Meeting : 6.00 p.m. Saturday
25. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
26. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
27. Ministers' Meeting : 6.00 p.m. First Saturday
28. Parents' Prayer : 4.00 p.m. First Sunday
29. Night Prayer : 9.30 p.m. Third Friday
30. Fasting Prayer : 9:30 a.m. Second Saturday
31. Holy Communion : Second Sunday Services
32. Youth / Kid Prayer : 10.00 p.m. daily
33. Staff Devotion : 9.00 a.m. daily
34. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

පැවසුවේය. ඉන්පසුව කවදාකවත් මේ පොලිස් නිළධාරියාව මා දුටුවේ නැත. පසුදින මා වතුර වීදුරුවක් ගෙන 'ස්වාමීන්වහන්සේගේ ලේ වලින් ජය තිබේ' කියා එම ස්ථානයේ සෑම තැනකටම ඉස්සෙමි. එම ස්ථානය මා හට ආරක්ෂිත ස්ථානයක් විය.

ඒ ගරාජයෙහි සිටි කාලයේදී බොහෝ පොලිස් නිළධාරීන් සමඟ මා මිත්‍රත්වයක් ඇතිකර ගත්තෙමි. බොහෝ දෙනෙකුට මා යේසුස් වහන්සේ ගැන පැවසුවෙමි. ඔවුන්ගේ ප්‍රශ්න වලට යාච්ඤා කලෙමි. ඒ අය අතරින් කීප දෙනෙක් යේසුස් වහන්සේව පිළිගත්තේය. මගේ සේවය නිසා ඔවුන් මට ඉතා හොඳින් සැලකූ අතර මට ගරු කලේය.

දෙවියන්වහන්සේ විවිධ ස්ථාන වලට මාව ගෙන ගියේය. ඉන්පසු මා හට ගෙයක් කුලියට ගැනීමට හැකිවිය. ස්වාමී වූ යේසුස් වහන්සේව විශ්වාස කරන්නාවූ අයට කිසි හිඟයක් නොවන්නේය. ඊයේත් අදත් හෙටත් සදාකාලයටම උන්වහන්සේ ඒකාකාරයි. ස්වාමීන්වහන්සේ ඔබගේ ජීවිතයෙහි ඉතා පුදුමාකාර දේ කරයි. කාන්තාරයේ මා යන ගමනේදී මා ක්ලාන්තයට පත්වීමට පුළුවන. එහෙත් මා සනසමින් ආශිර්වාද කරන බවට මා හට ඉතාම අනර්ඝ වූ හඬක් ඇසෙයි. රතු මුහුද මට විරුද්ධව පැමිණීමට පුළුවන. නමුත් ඒ සියල්ල තුළ ස්වාමීන්වහන්සේ මාව මුදවා මට මාවතක් විවර කිරීමට හැකිය. උන්වහන්සේ සැබවින්ම මාව මුදවමින් මට නව බලයක් දෙන සේක. මගේ සියලුම සතුරන් පරාජය කිරීමට මට බලය දෙන සේක.

****

RNI NO. TN/SIH/2006/17846

*....Contd. from page 7*

තවද උන්වහන්සේ අප සැමදෙනාටම ඉතා අනර්ඝ වූ ආශිර්වාදයන් දී තිබේ. උන්වහන්සේව අවංකවම සොයමින් උන්වහන්සේ අනුගමනය කරන්නාවූ අපටත් උන්වහන්සේගේ අණ පිළිපදින්නාවූ අයටත් ස්වාමීන්වහන්සේ පවසනුයේ, ***''යේසුස්වහන්සේ ඔවුන්ට කථා කොට සැබෑවක් නුඹලාට කියමි. අලුත් උත්පාදනයේදී මනුෂ්‍ය පුත්‍රයා තමන්ගේ තේජසේ සිංහාසනය පිට වැඩහිඳින කල මා අනුව ආවාවූ නුඹලාත් ඉශ්‍රායෙල්ගේ ගෝත්‍රයන් දොළොස විනිශ්චයකරමින් සිංහාසන දොළොසක් පිට හිඳින්නහුය.''*** *(මතෙව් 19:28)*

අප මේ පාපිෂ්ඨ වූ ලෝකයට ඉපදුනාවූ අය නිසා අප මෙම උතුම් ගැලවුම්කාරයාණන් සමඟ මේ ගමන යා යුතුය. අප උන්වහන්සේ උදෙසා පවිත්‍රවූ ජීවිතයක් ගත කරමු. *(1 පේත්‍රුස් 1:15)* ***''නුඹලා කැඳවූ තැනැන්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹලාත් නුඹලාගේ මුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා.''*** *(1 පේත්‍රුස් 1:15)* අප මෙම ගැලවුම්කාරයා සමඟ පවිත්‍රවූ ජීවිතයක් ගත කරමු. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරමින් ඔබට මඟපෙන්වන සේක.

## A good opportunity to get Echo of His Call monthly magazine free of cost

If you could send the addresses of your friends / relatives through post, letter, e.mail, WhatsApp or phone to us, we will dispatch **Echo of His Call** monthly magazine to them at free of cost.

# ECHO OF HIS CALL

**Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.**

**Annual Subscription : Rs. 100/-** **Life Subscription : Rs. 2000/-**

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
on 2nd APRIL 2024.
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
P.O. Box No. 2957,
Chepauk, Chennai - 600 005, INDIA.
Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766

***JESUS LOVES YOU!***

**To**

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**